දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2013 පරීක්ෂණය - 2016 සැප්තැම්බර්
Bachelor of Arts General (External) Degree Part I 2013 Examination - September 2016

සවිසා 2.1 - සම්භාව්‍ය සමාජ විද්‍යා න්‍යායේ පසුකාලීන වර්ධනය
SGYG 2.1 - Post Development in Classical Sociological Theory

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න.

---

01. සමාජ විද්‍යාත්මක න්‍යායේ ආරම්භය සහ වර්ධනය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

02. මානව ප්‍රගතිය සහ සමාජ ප්‍රගතිය පිළිබඳ ඕගස්ට් කොම්ට් (Auguste Comte) ගේ විග්‍රහය පිළිබඳ විශ්ලේෂණයක් කරන්න.

03. නූතන සමාජයෙහි සදාචාරාත්මක වශයෙන් ඉස්මතු වී ඇති අර්බුදකාරී තත්වයන් එමිල් ඩර්කයිම් (Emil Durkeim) ගේ අනෝමිය සිද්ධාන්තය (Anomic Theory) ඇසුරින් පහදන්න.

04. කාල් මාක්ස් (Karl Marx) ගේ භෞතිකවාදී දර්ශනය තුළ පැහැදිලි කෙරෙන "ඓතිහාසික භෞතිකවාදය" පිළිබඳ විවරණයක් සපයන්න.

05. ආගම සහ ආර්ථිකය (Religion & Economy) අතර ඇති සබඳතාවය පිළිබඳ සම්භාව්‍ය සමාජ විද්‍යාත්මක පැහැදිලි කිරීම්වලින් ප්‍රකට වන පරස්පරතාවන් විග්‍රහ කර දක්වන්න.

06. "නිලබල ක්‍රමය (Bureaucracy) පිළිබඳ පරමාදර්ශී ආකෘතිය (Ideal type), ආයතනික පරිසරයක් තුළ කාර්යක්ෂමතාවය නම් අරමුණ සාධනය කර ගැනීම සඳහා ගොඩනගන ලද්දකි." නිලබල පරමාදර්ශයන් ඇසුරින් පහදන්න.

07. "සමාජ ස්ථරායනය (Social Stratification) ආර්ථික සාධක මත පමණක් පදනම්ව නිර්මාණය වූවක් නොවේ." මැක්ස් වෙබර් (Max Weber) ගේ අදහස් ඇසුරින් විමසන්න.

08. පහත සඳහන් මාතෘකා දෙකක් සඳහා සටහන් සපයන්න.
   i. උපරි ව්‍යුහය (Super Structure) සහ අධෝ ව්‍යුහය (Infra Structure)
   ii. නීතිමය ආධිපත්‍ය (Legal Authority)
   iii. සමාජ පරිණාමය පිළිබඳ ස්පෙන්සියානු න්‍යාය
   iv. පරාරෝපණය (Alination)
   v. ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම (Protestant Ethics)